

# එක් අප්‍රසන්න සත්‍යයක්

**ගාමිණී දිසානායක**

*ඇමරිකා එක්සත් ජනපදයේ හිටපු සෙනේට් සභිකයෙකු හා උප ජනාධිපතිවරයෙකු ද වූ 59 හැවිරිදි අල්ගෝර් (Algore) පසුගිය ජනාධිපතිවරණයේ දී ජෝර්ජ් ඩබ්. බුෂ් ට පරාජයවූයේ ඡන්ද 537 කිනි. එහෙත් 2000 දී සිදු කෙරුණු ඊට අදාළ ඡන්ද ගණන් කිරීම මතභේදයට තුඩු දී ඇත්තකි.*

එසේවුවද පෘථිවිය උණුසුම්වීමේ (GLOBAL WARMING) බරපතළ අනතුරට එරෙහිව ඔහු විසින් නායකත්වය ගෙන සිදු කරන ලද සුවිශේෂ කාර්යභාරය හේතු කොට ගෙන, ඒ පිළිබඳ අවධානය යොමුකර සිටින ලෝක ජනතාව මිලියන 537 වාරයකටත් වඩා ඔහුට ඊට වැඩි ආදරයක් හා ගෞරවයක් දක්වති.

මේ හා සම්බන්ධ ඔහු ගේ එක් අප්‍රසන්න ඇත්තක්! AN INCONVENIENT TRUTH නමැති වාර්තා චිත්‍රපටය ප්‍රථම වරට ප්‍රදර්ශනය කරනු ලැබුවේ 2006 මැයි මාසයේ දී ය. එයට චිත්‍රපට පර්ෂද ත්‍යාගය (FILM ACADEMY AWARD හිමිවුණු අතර, කෑන්ස් (CANNES) සහ සන්ඩාන්ස් (SUNDANCE) ඇතුළු තවත් බොහෝ චිත්‍රපට උත්සව වලදී ගෞරව සම්මානයට පාත්‍රවිණි.

අල්ගෝර් සිය නිරීක්ෂණ හා නිර්දේශ මෙකී චිත්‍රපටය තුළින් ඉදිරිපත් කළ අතර ඒ හා සමග එනමින් වූ පොතද පළ කැරැවුයේය. එතැන් සිට එම සිනමාව හා පොත යන දෙකම හොඳින් අලෙවි වූයේ ය. ඔහු ගේ මුල් කෘතීන් වූ "පෘථිවියේ සමබරතාව" (EARTH IN THE BALANCE) සහ "පරිසර හා මනුෂ්‍ය ආත්මභාවය (ECOLOGH AND THE HUMAN SPIRIT) 1992 පළකරන ලදී.

ඇත්තට ම මෙම චිත්‍රපටය මඟින් සිනමා ශාලාවල කාර්යාලයීය ආදායම වාර්තා (BOX OFFICE) බිඳ දමා ඇති අතර, එය වාර්තා චිත්‍රපට අංශයේ වැඩිම ආදායමක් ද ලබා දී තිබේ. 2007 මැයි මස මැද භාගයේ දී උතුරු ඇමරිකාවේ දළ ආදායම ඇමරිකානු ඩොලර් 25 ක් වූ අතර, ලෝකය පුරා එය මිලියන 47 ක් විය. "ෆැරන්හයිට් 911" (FAHRENHEIT 911) දළ ආදායම ඩොලර් මිලියන 228 ක් වන විට 2005 පෙන්ග්වින් ප්‍රයාණය (MARTH OF THE PENGUINS) උතුරු ඇමරිකාවේ දී ඩොලර් මිලියන 77 ක් විය. ආදායම් ඉපදවීම අතින් මෙම වාර්තා චිත්‍රපට දෙක තවමත් පළමුවැනි හා දෙවැනි ස්ථානවල රැඳී සිටී.

CHICAGO SUN – TIMES පුවත්පතේ චිත්‍රපට විචාරකයාවූ රොගර් ඊබර්ට් ANINCONVENIENT TRUTH ගැන මෙසේ සඳහන් කර තිබේ. "චිත්‍රපට විචාරකයෙකු ලෙස ගෙවීගිය වගේ වසර 39 ක වෘත්තීය ජීවිතය තුළ දී කිසිවිටෙකත් මම මේ වචන ලියා නොමැත. එහෙත් දැන් එය ලියමි.ඔබ මේ චිත්‍රපටය බැලිය යුතුම වේ.

ස්වකීය දෙමවුපියන්ගේ උනන්දු කැරැවීම මත කියවූ රචෙල් කාර්සන් ගේ "නිහඬ වසන්තය" (SILENT SPRING) නමැති පොත සිය මුල් ළමා කාලයට ලොකු බලපෑමක් ඇතිකර ඇතැයි ඇල්ගෝර් පවසයි. වසර 40 ට පෙර විද්‍යාලයයේ දී ආචාර්යවරුන් විසින් ගල්අඟුරු, තෙල් හා ගෑස් දැවීම කරන විට වායුගෝලය තුළ වෙනස්කම් ඇතිවන ආකාරය උගන්වන විට, ඉහත පොත කියැවීමෙන් ලැබූ අවබෝධය වඩාත් ශක්තිමත් විය. ඔහුට දේශගුණික විපර්යාසය පිළිබඳ මූලික වැටහීමක් ලැබීමට ඉවහල් වූයේ මෙම අවබෝධය යි.

සමුද්‍ර ජීව විද්‍යාඥයකු වූ රචෙල් කාර්සන් (RACHEL CARSON 1907 – 1964) මුල දී ස්වාභාවික ඉතිහාසය (NATURAL HISTORY ගැන ලියා පසුව සමාජ විචාරකයකු (SOCIAL CRITIC) ලෙස ලේඛන කලාවට පිවිසි තැනැත්තියකි. ඇය ගේ ප්‍රථම ප්‍රකාශිත ග්‍රන්ථය වුයේ නිහඬ වසන්තය (SILENT SPRING) යි. 1962 දී එළි දුටු එය බටහිර රටවල බෙහෙවින් ප්‍රචලිත වූවකි. අනතුරුව යුරෝපය පුරා පරිසර සංවිධාන බිහිවීමට ද මේ පොත මූලික විය.

කෘමිනාශක (PESTICIDES) භාවිතය හේතුවෙන් පරිසරයට සිදුවන අයහපත් ප්‍රතිඵල පිළිබඳ එම ග්‍රන්ථයෙන් අවධාරණය කැරේ. කුරුල්ලන් විෂයයෙහි එය බෙහෙවින් හානිකර වෙයි. රසායනික නිෂ්පාදන පිළිබඳ පතුරුවා හරිනු ලබන ව්‍යාජ ප්‍රචාරයන් සහ රජයේ නිලධාරීන් අවිචාරාත්මකව ඒවා පිළිගැනීම පිළිබඳ කාර්සන් චෝදනා කරයි. ඩී.ඩී.ටී (DDT) වලට විකල්පයක් වන අහිතකර නොවන ජීව විද්‍යාත්මක පිවිසුමක් ද ඇය යෝජනා කර ඇත. ඩී.ඩී.ටී. වලින් බීජවල සියුම් මතු පිට තුනීවන අතර, එමඟින් උත්පත්තියට බාධා හා හානි සිදුවන අතර, ඒවා විනාශ වීම ද සිදු වේ.

### ඉතා ඉහළ ඉල්ලුමක්

වසර ගණනාවක් තිස්සේ අල්ගෝර්, දේශගුණික විපර්යාස සම්බන්ධ තොරතුරු එකතු කළේ ය. එමඟින් ඔහු අනාවරණය කරගත් කරුණු අන් අයටද පැහැදිලි කර දුන්නේය. මෙහි දී ඔහු සිය පණිවුඩ සටහන් කර ඉදිරිපත් කළේ චිත්‍රකාච මඟිනි.

බිල් ක්ලින්ටන් ගේ උප ජනාධිපතිවරයා වශයෙන් සේවය කළ අවුරුදු 8 ක කාලය පුරා හෙතෙම, නිහඬව මෙකී පරිසරය පිළිබඳ කාර්යයේද යෙදී සිටියේය. 2000 දී පැවැති ජනාධිපතිවරණයෙන් ජෝර්ජ් ඩබ්.බුෂ්ට පරාජය වීමෙන් පසු හේ ඉහත කටයුතු පූර්ණකාලීනව ඉදිරියට ගෙන ගියේය.

මේ අනුව මෙකල පවතින දේශගුණික විපර්යාසය හා බැඳී පවතින විවාදයේ දී අල්ගෝර්ට හිමිවන්නේ ප්‍රධාන ස්ථානයකි. එහෙයින් ඔහු ගේ වාර්තා චිත්‍රපටය, පොත හා දේශන වලට ලොකු ඉල්ලුමක් මතු වී තිබේ. එසේම එමඟින් සැලකියයුතු බලපෑමක් ද ඇති වී ඇත.

උදාහරණයක් වශයෙන් සලකතොත් ඔහු ගේ 'ANINCONVENIENT TRUTH' සංවර්ධිත දෘෂ්‍ය සංයුක්ත තැටිය (DVD) එංගන්තයේ හා වේල්සයේ හැම උසස් පාසලකට ම බෙදාහැර තිබේ. කැනඩාවේ බොහෝ උසස් පාසල්වල ශිෂ්‍ය - ශිෂ්‍යාවන්ට එය නැරඹීමට අවස්ථාව සලසා ඒ ගැන සාකච්ඡා ද පැවැත්වේ. මෙම චිත්‍රපටය තුළ දේශගුණික වෙනස්වීම් පිළිබඳ දත්ත හා අනාවැකි දිග හැරෙන්නේ අල්ගෝර් ගේ පෞද්ගලික අත්දැකීම් ද සමඟ ය. මූලික ඉදිරිපත් කිරීම් සමඟ ඊට එකතු කළ චිත්‍රකාච දර්ශනයක් (THE SLIDE SHOW) ද ප්‍රදර්ශනය වේ. මෙය සම්පූර්ණ ලෝකයම අළලා ඉදිරිපත් කෙරෙන්නකි. මෙහි දී පෘථිවිය උණුසුම් වීම කෙරෙහි බලපාන විද්‍යාත්මක සාධක අල්ගෝර් ගේ විමැසුමට ලක් වේ. ඊට තුඩු දෙන දේශපාලනය හා ආර්ථිකය ගැන ද සාකච්ඡා කෙරේ. එසේම ඉදිරි අනාගතය තුළ ලෝකය පුරා ක්‍රියාත්මක වන මිනිසා විසින් නිර්මිත හරිතාගාර (GREEN HOUSES) වායුව සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු කිරීමට කටයුතු නොකළහොත් ඇතිවන අනිෂ්ට ප්‍රතිඵල ද ඔහු ගේ පිළිගැනීම අනුව ඉදිරිපත් කෙරෙයි.

කෙසේවුවද පෘථිවිය උණුසුම් වීමේ ක්‍රියාවලිය බියවිය යුතු තරම් බරපතල එකක් නොවන බවටත් එවැන්නක් මෙතෙක් ඔප්පුකර නොමැති බවටත් අවලාද නඟන ප්‍රකට විචාරකයන්ට පිළිතුරු දීමට ද මෙම චිත්‍රපටයෙන් උත්සාහ දරා තිබේ. උදාහරණයක් වශයෙන් ග්‍රීන්ලන්තයේ සහ බටහිර ඇන්ටාර්ක්ටිකාවේ හිම තට්ටු (ICESHEET) දියවී කැළඹීමෙන් ඇතිවන බරපතළ අවදානම ගෝර් සාකච්ඡා කරයි. මේ හේතුවෙන් පෘථිවියේ සාගර ජල මට්ටම අඩුම වශයෙන් මීටර් 06 (අඩි 20) දක්වා ඉහළ යන අතර, වෙරළාසන්න ප්‍රදේශ මුහුදු වතුරෙන් යටවී මිලියන 100 ක ජනතාව අනාථභාවයට පත් වේ. ග්‍රීන්ලන්තයේ හිම දියවී ගලා එන ජලයේ ලවණතාවය (SALINITY) හීන බැවින් එමඟින් ගල්ෆ් දිය පහරවල වේගය නැවැතී උතුරු යුරෝපය තුළ විස්මයජනක සීතලක් හටගනී.

පෘථිවිය උණුසුම්වීමේ ආශ්චර්යය (PHENOMENON) විස්තර කිරීමේ දී මෙම චිත්‍රපටයෙන් ඇන්ටාර්ක්ටිකා හිම තට්ටුවල අවුරුදු 600.000 ක් පුරා පැවති සෙල්සියස් අංශක 02 ක උෂ්ණත්වය ද පරීක්ෂා කෙරේ. ඇමරිකා එක්සත් ජනපදයේ නිවාස මිලියනයක් විනාශ කළ කත්රිනා කුණාටුව (HARRICANE KATRINA) විසින් මුහුදුරළ මට්ටම අඩි 30 – 45 දක්වා ඉහළ ගිය ආකාරයේ සමානත්වයක් මෙහි උපමිතියක් (AN ANALOGY) පරීක්ෂාකර බැලීමේ දී පෙනී ගොස් තිබේ.

මෙම වාර්තා චිත්‍රපටය අවසාන වන්නේ අල්ගෝර් ගේ අවධාරණාත්මක සටහනකිනි. ඒ අනුව කාබන්ඩයොක්සයිඩ් (CARBONDIOXIDE) වායුව පිටකිරීම අවම කිරීමෙන් හා අලුතින් හා වැඩි

බිල් ක්ලින්ටන් ගේ උප ජනාධිපතිවරයා වශයෙන් සේවය කළ අවුරුදු 8 ක කාලය පුරා හෙතෙම, නිහඬව මෙකී පරිසරය පිළිබඳ කාර්යයේද යෙදී සිටියේය. 2000 දී පැවැති ජනාධිපතිවරණයෙන් ජෝර්ජ් ඩබ්.බුෂ්ට පරාජය වීමෙන් පසු හේ ඉහත කටයුතු පූර්ණකාලීනව ඉදිරියට ගෙන ගියේය. මේ අනුව මෙකල පවතින දේශගුණික විපර්යාසය හා බැඳී පවතින විවාදයේ දී අල්ගෝර්ට හිමිවන්නේ ප්‍රධාන ස්ථානයකි.

වැඩියෙන් ගහකොළ වැවීමෙන් පෘථිවිය උණුසුම්වීමේ අවදානම සාර්ථක ලෙස සමනය කළ හැකි බව හෙතෙම සඳහන් කරයි.

අල්ගෝර් එමඟින් මේ පිළිබඳ උනන්දුවක් දක්වන අය ධෛර්යමත් කරන අතර, මෙම ප්‍රයත්නයේ දී ඔවුන්ට කළ හැකි දේ හා එය කළ යුතු ආකාරය ද ඉගෙන ගත යුතු යැයි සඳහන් කර තිබේ.

### විද්‍යාත්මක ඒකමතිකභාවය

දේශගුණික වෙනස්වීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ IPCC ජාත්‍යන්තර මණ්ඩලය (IPCC) විසින් නිකුත් කර තිබෙන අලුත්ම වාර්තාවේ සඳහන් වන ආකාරයට මෙකී දේශගුණික විපර්යාස ප්‍රධාන වශයෙන් හටගැනී ඇත්තේ මිනිස් ක්‍රියාකාරිත්වයේ ප්‍රතිඵල වශයෙනි. එම වාර්තාවේ ඒ පිළිබඳ කිසිදු සැකයකට ඉඩ තබා නැත. වෙනත් ආකාරයකට කියතොත් 2007 IPCC වාර්තාවේ පූර්වෝක්ත මිනිස් ක්‍රියාකාරකම්, පසුගිය දශකයේ පෘථිවිය උණුසුම්වීමේ මූලික වගකීමක් දැරිය යුතු බව දක්වා තිබේ. විද්‍යාඥයන්ගෙන් 90% ක් ම එම අදහස් සහතික කර ඇත. එම අනතුරු ඇඟවීම් අනුව ලොවපුරා සියලු රාජ්‍යයන්ට එකී අනතුර අවම කිරීමට අදාළ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා බරපතළ බලපෑමක් - පෙළැඹවීමක් එල්ල වී තිබේ.

*2006 සැප්තැම්බර් මාසයේ දී අල්ගෝර් ඔස්ට්‍රේලියාවේ සිඩ්නි නගරයට ගියේ මෙම වාර්තා චිත්‍රපටය ප්‍රචාරය කිරීමේ කටයුතු සඳහා ය. එවකට ඔස්ට්‍රේලියාවේ අගමැතිව සිටි ජෝන් හොවාර්ඩ් කියා සිටියේ මෙම චිත්‍රපටය වෙනුවෙන් තමා ගෝර් හමුනොවෙනවා පමණක් නොව, ක්යෝටෝ ගිවිසුම (KYOTO PROTOCOL) ට එකඟවන්නේද නැති බවයි.*

බැවින් ප්‍රතිපත්ති සැලසුම් කරන්නන් සඳහා එම වාර්තාවේ සඳහන් වැදගත් කාරණා පිළිබඳ සාරාංශයක් මෙහි අන්තැනක සඳහන් කර ඇත.

ාර්වඩ් විශ්ව විද්‍යාලයේ උපාධිධරයකු වන අල්ගෝර් (1969) ගේ පෘථිවිය උණුසුම්වීම පිළිබඳ ප්‍රකාශය හා මිනිස් ක්‍රියාකාරිත්වය ඊට හේතු වී තිබෙන ප්‍රධාන සාධකය යැයි කෙරෙන චෝදනාවද මෙකී (IPCC) වාර්තාවෙන් සනාථ කර ඇත.

)හෙත් බලාපොරොත්තු වූ පරිදි ම දක්ෂිණාංශික විචාරකයෝ අල්ගෝර් සමච්චලයට ලක්කළහ. සෙනේට් සභික ජිම් ඉන්හෝෆ් සභාපති පදවිය දැරූ කාලයේ ඇමරිකා එක්සත් ජනපදයේ පාරිසරික හා මහජන සේවා පිළිබඳ කාරක සභාව පෘථිවිය උණුසුම්වීම පිළිබඳ පිළිගැනීම සැක කළේ ය. ඔවුන් ගේ ඒ පිළිබඳ වූ පහත දැක්වෙන ප්‍රකාශය ද මෙම චිත්‍රපටයට ඇතුළත් කර ඇත.

'පෘථිවිය උණුසුම්වේය යන ප්‍රකාශය තරම් ඇමරිකානු ජනතාවට අනර්ථයක් සිදු කළ වෙනත් දෙයක් නොමැත."

**දේශපාලනමය ප්‍රතිචාරය**

අල්ගෝර් ගේ "එක් අප්‍රසන්න සත්‍යයන්" වාර්තා චිත්‍රපටයට ලෝකය පුරා යහපත් දේශපාලනික පිළිගැනීමක් ලැබිණි. එය ජාත්‍යන්තර ජනතාව ප්‍රමාණවත් ලෙස දැනුවත් කිරීමට පුරෝගාමීවූවක් හැටියට එක්තරා ගෞරවයක් ද හිමිකර ගත්තේ ය. එහි ප්‍රතිඵල වශයෙන් බොහෝ රාජ්‍යයන් දේශගුණය ගැන හා එය වැඩි දියුණු කිරීම ගැන අවධානය යොමු කරන්නට විය. ඇමරිකා එක්සත් ජනපදයේ පමණක් සැලකිය යුතු පාසල් ගණනාවක මෙම චිත්‍රපටය විද්‍යා විෂය මාලාවට අත්‍යවශ්‍ය එකක් හැටියට පාවිච්චි කළේ ය. එහෙත් ඇමරිකාවේම එක් දිස්ත්‍රික්කයක එය පන්තිකාමරය ඇතුළට ගන්නවාට විරුද්ධව තහනම් නියෝගයක් ක්‍රියාත්මක විණි.

"ඔබ මේ චිත්‍රපටය බලනවා දැයි" වරක් ජනාධිපති බුෂ් ගෙන් විමසූ විට ඔහු පිළිතුරු දී තිබෙන්නේ"සැක සහිතයි" කියාය. එහෙත් පසුව හෙතෙම මෙසේ කියා ඇත. "මගේ තීරණය අනුව මෙහිදී හරිතාගාර වායුව, මනුෂ්‍ය ක්‍රියාකාරිත්වය හා ස්වාභාවික හේතූන් පසෙක තැබිය යුතුය. තාක්ෂණය පිළිබඳ සැලකිලිමත් වීමේ දී පරිසරය ආරක්ෂා කරමින් අපට වඩා හොඳ ජීවිතයක් ගත කළ හැකිවේ. අල්ගෝර් ඊට මෙලෙස ප්‍රතිචාර දක්වා ඇත. "පෘථිවිය උණුසුම් වීම පිළිබඳ මුළු ලෝකයේම විද්‍යාඥයන් ඒක මතිකව ඊට වගකිවයුත්තේ මනුෂ්‍ය ක්‍රියාකාරිත්වය යැයි කියා සිටිය දී, බුෂ් ඊට ප්‍රතිවිරුද්ධ අදහසක් පළ කිරීමෙන් හෙළිදරව් වන්නේ, එය සත්‍යයක් ලෙස පිළිගැනීමට ඔහු තුළ ඇති බලවත් නොකැමැත්තයි.

2006 සැප්තැම්බර් මාසයේ දී අල්ගෝර් ඔස්ට්‍රේලියාවේ සිඩ්නි නගරයට ගියේ මෙම වාර්තා චිත්‍රපටය ප්‍රචාරය කිරීමේ කටයුතු සඳහා ය. එවකට ඔස්ට්‍රේලියාවේ අගමැතිව සිටි ජෝන් හොවාර්ඩ් කියා සිටියේ මෙම චිත්‍රපටය වෙනුවෙන් තමා ගෝර් හමුනොවෙනවා පමණක් නොව, ක්යෝටෝ ගිවිසුම (KYOTO PROTOCOL) ට එකඟවන්නේද නැති බවයි. එහෙත් ඔස්ට්‍රේලියානු ෆෙඩරල් ආණ්ඩුව 2006 ඔක්තෝබර් මාසයේ සිට එරට ජනතාව වෙනුවෙන් පාරිසරික ව්‍යාපෘති කීපයක් ම ක්‍රියාත්මක කළේය.

සම්මතවාදී එක්සත් ජනපද පාසල් මණ්ඩල මේ පොත හෝ එහි වාර්තා චිත්‍රපටිය හෝ එම පාසලේ පන්තිකාමරයකට ගෙන ඒමට පෙර ඊට ප්‍රතිවිරුද්ධ මතවාද (OPPOSING VIEWS) මඟින් ළමයින් දැනුවත් කර සිටිය යුතු යැයි නියමයක් කර තිබිණි.

එක්සත් රාජධානිය දේශගුණික විපර්යාස පිළිබඳ අන්තර් රාජ්‍ය මණ්ඩලයේ IPCC වාර්තාව අධ්‍යයනය කර, ඒ අනුව එම දේශගුණික වෙනස්වීම් එරට ආර්ථිකයට බලපාන ආකාරය පිළිබඳ ස්ටර්න් විමර්ශන වාර්තාව (STERN REVIEW) අනුව ප්‍රකාශයක් කරමින්, එංගලන්තයේ හා වේල්සයේ සියලුම ද්විතීය පාසල්වලට මෙම පොතේ හා වාර්තා චිත්‍රපටයේ පිටපත් බෙදා හැර, ඒ පිළිබඳ ශිෂ්‍ය - ශිෂ්‍යාවන් දැනුවත් කිරීමට නියම කර තිබේ. ස්කොට්ලන්තයේ සිව්වැනි හා සයවැනි ශ්‍රේණිවල අධ්‍යයන පාඨමාලාවට ද මෙම චිත්‍රපටය ඇතුළත් කර ඇත.

2006 නොවැම්බර් මාසයේ දී එක්සත් රාජධානියේ භාණ්ඩාගාර ආර්ථික විද්‍යාඥ සහ ලෝක බැංකුවේ හිටපු ප්‍රධාන ආර්ථික විද්‍යාඥ ශ්‍රීමත් නිකලස් ස්ටර්න් ගේ දේශගුණික විපර්යාශය හා ආර්ථිකය පිළිබඳ කරනු ලැබූ විමර්ශන වාර්තාවේ සඳහන් ප්‍රධාන කාරණා කීපයක් පහත දැක්වේ.

1. පිටකරනු ලබන අංගාරික (CARBON) මඟින් දැනටමත් පෘථිවියේ උෂ්ණත්වය සෙල්සියස් අංශක 5 (0.5) ට වැඩිවී ඇත.
2. හරිතාගාරවායුව (GREENHOUSE GASES) අයම කිරීමට කටයුතු නොකළහොත් ඉදිරි වසර 50 ඇතුළත දී පෘථිවියේ උෂ්ණත්වය තවත් සෙල්සියස් අංශක 2 – 3 (2.3.) කින් වැඩිවේ.
3. මෙකී වැඩිවන උෂ්ණත්වය මඟින් ග්‍රහලෝකයේ භෞතික භූගෝලීය පැවැත්ම මෙන්ම, අපගේ ජීවන ක්‍රමයද වෙනස් කරනු ඇත.
4. ගංවතුර, ලෙඩරෝග, කුණාටු හා නියඟය නිරතුරුව ඇතිවනු දක්නට ලැබේ.
5. මෙබඳු අපහසුතා හා අපදාවලට ඉක්මනින් හා පහසුවෙන් ගොදුරුවන්නේ දුප්පත් හා නොදියුණු රටවල් ය.
6. මෙකී දේශ ගුණික විපර්යාසය මඟින් ලෝකයේ දළ නිෂ්පාදනය 5% - 25% දක්වා ප්‍රමාණයකින් අඩුවනු ඇත.
7. හරිතාගාර වායුව පිටවීම අවම කිරීම සඳහා කටයුතු කිරීමේ දී සංවර්ධන වේගයේ ප්‍රතිශතය (GDP) සියයට 1 කින් (1%) අඩුකරනු ඇත.
8. කාබන්ඩයොක්සයිඩ් වායුව (CO පිටවීම වැළැක්වීමට පියවර නොගතහොත් එහි සෑම ටොන් එකකින්ම අවම වශයෙන් ඩොලර් 85 ක පාඩුවක් සිදුවේ.
9. වායුගෝලයේ පැවැතිය යුතු කාබන්ඩයොක්සයිඩ් වායු ප්‍රමාණය දස ලක්ෂයකින් එක් කොටසක දී 450 – 550 දක්වා වූ සමතාවකින් යුක්ත විය යුතු ය.
10. තාක්ෂණය – උපයෝගී කර ගැනීමේ දී ජාත්‍යන්තර සම්මුතිය ශක්තිමත් වන පරිදි, කාබන්ඩයොක්සයිඩ් වායුවේ නියමිත අගය පවත්වා ගෙන යෑමට ක්‍රියා කළ යුතු වේ.

**ඉතිරි කොටස ඊළඟ කලාපයේ**

**පරිවර්තනය**

**සිරිල් අභයගුණවර්ධන**